සියලුම හිමිකම් ඇවිරිණි
All Rights Reserved

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

# තෙවන වාර පරීක්ෂණය 2020

10 ශ්‍රේණිය **ක්‍රිස්තියානි ධර්මය I** කාලය පැය 1 යි

නම/ විභාග අංකයඃ

- සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න. මෙම ප්‍රශ්න පත්‍රය සඳහා ලකුණු 40 ක් හිමිවේ.
- 1 සිට 40 තෙක් ප්‍රශ්නවල දී ඇති 1, 2, 3, 4 පිළිතුරුවලින් නිවැරදි පිළිතුර තෝරන්න.
- ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරින් ඔබ තෝරාගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය තුළ (X) ලකුණ යොදන්න.

---

01. දෙවියන් වහන්සේගේ කැඳවීම තුළ දේව පණිවිඩය ජනතාවට පිළිගැන්වූ තැනැත්තා වූයේ,
(1) රජතුමා ය. (2) දිවැසිවරයා ය. (3) පූජකතුමා ය. (4) ලෙව්වරයා ය.

02. මුළු මානව වර්ගයාටම සුභාරංචියක් වූ අතර ඔවුන්ට ගැළවීම අත්කර දුන් දිව්‍යමය ක්‍රියාවලිය වන්නේ,
(1) දේව ක්‍රියාකාරීත්වයයි. (2) ආබ්‍රහම්ගේ ඇදහිල්ලයි.
(3) කිතු උපත සිදුවීමයි. (4) මෝසෙස්ගේ උපත සිදුවීමයි.

03. "මට පෙරටුව ගොස් මාගේ මාර්ගය පිළියෙල කරන්නා වූ මාගේ දූතයා මට පෙරටුව එවන්නෙමි. මෙම දිවැස්වැකියෙන් සඳහන් වන්නේ,
(1) ස්නාවක ජොහන් ගැනය. (2) ජේසුස් වහන්සේ ගැනය.
(3) පාවුල්තුමා ගැනය. (4) පේදුරුතුමා ගැනය.

04. ජේසුස් වහන්සේගේ සේවකත්වය පිළිබඳ ඉතියෝපීය නපුංසකයාට ශුද්ධ ලියවිලි පහදා දුන්නේ,
(1) පේදුරු විසින් ය. (2) ජොහන් විසින් ය. (3) මතෙව් විසින් ය. (4) පිලිප් විසින් ය.

05. ස්නාවක ජොහන්තුමා ජනතාව ස්වාමින් වහන්සේ වෙත ගෙන ඒමට ක්‍රියා කරනු ලැබුයේ,
(1) මනස්ථාපනයේ බෞතීස්මය ලබාදීමට ය. (2) දේව රාජ්‍යය ප්‍රකාශ කිරීමට ය.
(3) ජොර්දාන් ගඟේ බෞතීස්මය කිරීමට ය. (4) ජනතාවගේ පව් කමා කිරීමට ය.

06. ජේසුස් වහන්සේගේ හා ස්නාවක ජොහන්තුමාගේ උපත්වලට අදාළව වැදගත් වන්නා වූ පුද්ගල චරිත වන්නේ,
(1) ජොසෙප්තුමා, සෙකරියස්තුමා, එළිසැබෙත්තුමිය හා අන්නාතුමිය ය.
(2) ජෝසෙප්තුමා, සිමියොන්තුමා, මරියතුමිය හා එළිසැබෙත්තුමිය ය.
(3) ජෝසෙප්තුමා, මරියතුමිය, සෙකරියස්තුමා හා එළිසැබෙත්තුමිය ය.
(4) ජෝසෙප්තුමා, සෙකරියස්තුමා, සිමියොන්තුමා හා අන්නාතුමිය ය.

07. කිතුණු අපගේ කන්නලව් දෙවියන් වහන්සේට ඉදිරිපත් කිරීමේ දී අප ළඟ තිබිය යුතු වැදගත්ම ගුණාංග වන්නේ,
(1) කැපවීම හා කීකරුකමයි. (2) ඇදහිල්ල හා කැපවීමයි.
(3) විශ්වාසය හා කීකරුකමයි. (4) විශ්වාසය හා ඇදහිල්ලයි.

08. තම මෙහෙවර උදෙසා වැයවෙමින්, කැපවෙමින් යාච්ඤාවෙන් හා භාවනාවෙන් යුතුව සූදානම් වූයේ,
(1) පාවුල්තුමා ය. (2) ජේසුස් වහන්සේ ය.
(3) ස්නාවක ජොහන්තුමා ය. (4) පේදුරුතුමා ය.

09. තම මරණයට පෙර මෙසියස් වහන්සේ දකින බවට අනාවරණය කරන ලද්දේ,
(1) පේදුරුතුමා ය. (2) ජොහන්තුමා ය. (3) සීමොන්තුමා ය. (4) සිමියොන්තුමා ය.

10. සමාජය තුළ ජුදෙව් අනන්‍යතාව දැරීමේ භාහිර සංකේතයක් ලෙස ඉටු කළ චාරිත්‍රය වන්නේ,
(1) කැපකිරීමයි. (2) බෞතීස්ම කිරීමයි.
(3) චර්මච්ඡේදනයයි. (4) දේවමාළිගාවට යෑමයි.



මෙම ප්‍රශ්න පත්‍ර සියලුම සෞඛ්‍යාරක්ෂිත ක්‍රමවේද අනුගමනය කරමින් සෞඛ්‍ය අමාත්‍යාංශයේ නිර්දේශ අනුව මුද්‍රණය, පැකට් කිරීම හා බෙදාහැරීම සිදුකර ඇත.

11. රෝම අධිරාජ්‍යයට යටත්ව තිබූ පලස්තීනයේ ස්නාවක ජොහන්ගේ පණිවිඩය යොමු වූ ප්‍රදේශ වන්නේ,
   (1) ජුදය, ගලීලය, ඉතුරය හා ත්‍රිකෝනිය ය.   (2) ජුදය, ඉතුරය, ගලීලය හා පිනිසිය ය.
   (3) ගලීලය, ත්‍රිකෝනිය, පිනීසය හා ඉතුරය ය.   (4) ජුදය, ඉතුරය, පෙරයාව හා ගලීලය ය.
12. ජොහාන්තුමා යුක්තිය හා සාධාරණත්වය වෙනුවෙන් අවවාද කරනු ලැබුවේ,
   (1) පොදු ජනතාවට ය.   (2) රාජ්‍ය සේවයේ යෙදීසිටි අයට ය.
   (3) ආරක්ෂක අංශයට ය.   (4) ජුදා ආගමික ජනතාවට ය.
13. ඉගැන්වීම තුළින් ආගමික දැනුම ලබාදීම සඳහා යොදාගත් මධ්‍යස්ථානය වූයේ,
   (1) සිනගෝගයයි.   (2) දේවමාළිගාවයි.
   (3) රජමැදුරයි.   (4) උත්තම පූජක මැදුරයි.
14. ජේසුස් වහන්සේ තම සේවය ආරම්භයේදී ම බිඳ හෙලන ලද ජුදෙව් විශ්වාසයක් වන්නේ,
   (1) දෙවියන් වහන්සේ මැව්වේ ජුදෙව්වරුන් පමණක් බවය.
   (2) මෙසියස් වහන්සේ හා දේව රාජ්‍ය තමන් සතු බවය.
   (3) ජුදෙව්වකු විය හැක්කේ දේව වරප්‍රසාදයෙන් පමණක් බවය.
   (4) දෙවියන් වහන්සේ අන්‍ය ජාතීන් ප්‍රතික්ෂේප කරන බවය.
15. සීමොන් ජේසුස් වහන්සේගේ පාද පාමුල වැඳ වැටුනේ ඔහු එතුමන්ගේ
   (1) රූප විපර්යාසය අත්දුටු නිසාය.   (2) උත්පත්තිය අත්දටු නිසාය.
   (3) බෞතීස්මය අත්දුටු නිසාය.   (4) ශුද්ධවන්තකම හා බලය අත්දුටු නිසාය.
16. ධර්මදූත සේවයේදී මුහුණදීමට සිදුවන පීඩා හා අභියෝග පිළිබඳව ඇඟවීමට ජේසුස් වහන්සේ ප්‍රකාශ කළේ,
   (1) අන්ධකාරයේ ඇවිදීම යනුවෙනි.   (2) වග වලසුන් මැදට යවමි යනුවෙනි.
   (3) දුෂ්කර මාර්ගයක ගමන යනුවෙනි.   (4) නගුලට අත තබා ආපසු බැලීම යනුවෙනි.
17. දේව රාජ්‍යයේ වර්ධනයට කාන්තාවන් කොටස්කරුවන් වීමට දොරටු විවෘත කිරීමක් වන්නේ බෙතානීයේ නිවසේදී ජේසුස් වහන්සේ
   (1) මාර්තාගේ ආගන්තුක සත්කාර අගය කිරීමෙනි.
   (2) මාර්තාගේ අයදීමට සංවේදී වීම ප්‍රතික්ෂේප කිරීමයි.
   (3) මරියා යහපත් දේ තෝරා ගැනීම ඇගයීමට ලක්කිරීමයි.
   (4) මරියා තම සහෝදරියට උපකාර කිරීමට යාමයි.
18. සමාජයේ ප්‍රතික්ෂේප වූ හා කොන් කිරීමට ලක්වූ එහෙත් ජේසුස් වහන්සේ විසින් පිළිගැනීමට ලක්වූ පුද්ගලයන් දෙදෙනා වන්නේ,
   (1) සාකෙවුස් හා ලාසරස් ය.   (2) සාකෙවුස් හා ජුදස් ය.
   (3) ලාසරස් හා ලාදුරු රෝගියා ය.   (4) සාකෙවුස් හා ලාදුරු රෝගියා ය.
19. ජුදෙව්වන් දේශද්‍රෝහීන් හා පව්කරුවන් ලෙස සලකා පිළිකුල් කරනු ලැබුයේ,
   (1) අයකැමියන් ය.   (2) පරිසිවරුන් ය.   (3) දිළින්දන් ය.   (4) රෝගීන් ය.
20. ජේසුස් වහන්සේ ගතානුගතික නියමයන්වලට වහල්වී අර්ථ විරහිතව සිදුකරනු ලබන වත් පිළිවෙත්වල නිසරුකම පෙන්වා දෙන අවස්ථාවක් වන්නේ,
   (1) අංශභාග රෝගියා සුවකිරීම ය.   (2) ලෙවී කැඳවීම ය.
   (3) සබතකඩ කිරීමේ ප්‍රශ්නය ය.   (4) උපවාසය පිළිබඳ ප්‍රශ්නය ය.
21. පරිසිවරුන් ප්‍රචලිත කළත් සද්දුසිවරුන් පිළිනොගත් ධර්මතාවයක් වූයේ,
   (1) මනස්ථාපනයේ බෞතීස්මයයි.   (2) දේවදූතයින් හා පුනර්ජීවනයයි.
   (3) ලිඛිත ව්‍යවස්ථාවයි.   (4) දේව රාජ්‍යයයි.
22. ජුදා ජනතාවට දේවමාළිගාවේ බද්ධ ගෙවීමේදී ව්‍යවස්ථාවෙන් තහනම් කර තිබුනේ,
   (1) යමකුගේ රූපය මුද්‍රිත කාසිවලින් ගෙවීම ය.
   (2) රෝම කාසිවලින් ගෙවීම ය.
   (3) රිදීකාසිවලින් ගෙවීම ය.
   (4) විජාතීන්ගේ කාසිවලින් ගෙවීම ය.

23. ජේසුස් වහන්සේ රාජ තේජසින් ජෙරුසලමට යාම සඳහා කොටළුවකු තෝරා ගැනීමෙන් සංකේතවත් වන්නේ,

(1) රණකාමීත්වයයි. (2) ජයග්‍රාහිකත්වයයි.

(3) අහිංසකත්වයයි. (4) පණ්ඩිතත්වයයි.

24. කිතුනු අප ජේසුස් වහන්සේගේ රැළට එකතුවීමේ ඒකායන අරමුණ විය යුත්තේ,

(1) ලෞකික සැප සම්පත් හිමිකර ගැනීමයි. (2) දේව රාජ්‍යය හිමිකර ගැනීමයි.

(3) සමාජය තුළ කැපී පෙනීමට හැකි වීමයි. (4) හාස්කම් දැකීමට හැකි වීමයි.

25. ගෙත්සමන උයනේදී ශ්‍රාවකයන් ශෝකය නිසා නිදා සිටිනු දුටු ජේසුතුමා ඔවුන් දිරිමත් කරනු ලැබුයේ,

(1) ''මාගේ කැමැත්ත නොව ඔබගේ කැමැත්ත වේවාය'' පවසමින් ය.

(2) ''පරීක්ෂාවට නොවැටෙන පිණිස නැගිට යාච්ඤා කරන්න යැයි'' පවසමින් ය.

(3) ''යාච්ඤාවෙන් ශක්තිමත් ව ධෛර්යයමත්වන්න යැයි'' පවසමින් ය.

(4) ''මා සිහිකිරීම පිනිස මෙය සිදුකරන්න යැයි'' පවසමින් ය.

26. යුක්තියට පිටුපා තම තනතුර රැකගත් අයකුට හොඳම උදාහරණය වන්නේ,

(1) උත්තම පූජකයා ය. (2) හෙරොද් රජතුමා ය.

(3) විනයධරයන් ය. (4) පිලාත් ආණ්ඩුකාරයා ය.

27. ජේසුස් වහන්සේ කුරුසිපත් කිරීමට පිලාත් විසින් තීන්දු කරනු ලැබුයේ,

(1) ජනතාව උද්ඝෝෂණය කළ නිසාය.

(2) සැබෑ විනිශ්චයක් ලබා දීම සඳහා ය.

(3) නීතිය අකුරටම ක්‍රියාත්මක කිරීම සඳහා ය.

(4) නීතියේ සාධාරණත්වය ජනතාවට පෙන්වීමට ය.

28. ජේසුස් වහන්සේගේ මෘත දේහය සොහොනක තැම්පත් කිරීමට භාරගනු ලැබුයේ,

(1) සිරේනියේ සීමොන් ය. (2) සිරේනියේ ජෝසෙප් ය.

(3) අරමාතියේ ජෝසෙප් ය. (4) අරමාතියේ සීමොන් ය.

29. ජේසුස් වහන්සේ කුරුසිය මත අවසන් හුස්ම හෙලන අවස්ථාවේ දී කළ ප්‍රකාශය වන්නේ,

(1) ''පියාණෙනි ඔවුනට කමා වුව මැනව'' යනුවෙනි.

(2) ''ජෙරුසලමේ දූවරුනි මා නිසා නොහඬන්න'' යනුවෙනි.

(3) ''පියාණෙනි ඔබගේ හස්තයට මාගේ ආත්මය භාරදෙමි'' යනුවෙනි.

(4) ''දෙවියන් වහන්සේ අප සමඟ සදාකාලිකව වැඩ වසන්නේය'' යනුවෙනි.

30. ජේසුස් වහන්සේගේ පුනර්ජීවනය පිළිබඳ විශ්වාසය නොමැති අය ක්‍රියා කරනුයේ,

(1) තමාට පැමිණෙන ගැටලු පිළිබඳ ලතවීමයි.

(2) ධනය රැස්කිරීමට යොමු වීමයි.

(3) වෙනත් විශ්වාසයන් වෙත ගමන් කිරීමයි.

(4) උන්වහන්සේ මළවුන් අතර සෙවීමයි.

31. දේව අභිමුඛත්වය හා බලයත් පාපයෙන් දවාලා පිරිසිදුවීමත් සංකේතවත් කරනු ලබන්නේ,

(1) ජලය මගින් ය. (2) ගින්න මගින් ය. (3) සුළඟ මගින් ය. (4) වාතය මගින් ය.

32. වර්තමාන සමාජයේ ලෞකිකත්වයට වහල් වූවන් හට ජේසුතුමා පවසන්නේ,

(1) සැමවිටම ධනය රැස් කිරීමට යොමුවන්න යනුවෙනි.

(2) ''සත්‍ය හා යුක්තිය කෙදිනක හෝ ජයගන්නවා'' යනුවෙනි.

(3) ''නුඹේ දෙවි ස්වාමින් වහන්සේට පමණක් නමස්කාර කරන්න'' යනුවෙනි.

(4) හාස්කම් කරනු ලබන තැන්වලින් සේවය ලබන්න යනුවෙනි.

33. පහත සඳහන් වන්නේ ජේසුස් වහන්සේ පාළුකරයේ දී පරීක්ෂාවන්ට දුන් ප්‍රතිචාරයන් ය.

A මිනිසා කෑමෙන් පමණක් ජීවත් නොවන්නේ ය.

B නුඹේ දෙවි වූ ස්වාමින් වහන්සේට පමණක් නමස්කාර කරන්න. උන්වහන්සේට පමණක් සේවය කරන්න.

C සාතන් මා වෙතින් ඉවත්ව යව

D නුඹේ දෙවි ස්වාමින් වහන්සේ පරීක්ෂා නොකරන්න.

මේවා අතුරෙන් පිළිතුරු දුන් ආකාරය පිළිවෙලට ඇති වරණය වන්නේ,

(1) A, C හා D ය. (2) A, B හා C ය. (3) B, C හා D ය. (4) A, B හා D ය.

34. ජේසුස් වහන්සේගේ ජීවිතයේ ඉතා වැදගත් සිද්ධීන් අතර සත්‍යතාවයේ ආලෝකයාණන් අනාවරණය වූ අවස්ථාවක් වන්නේ,

(1) ජේසුස් වහන්සේගේ බෞතීස්මය ය. (2) ස්වර්ගාරෝහණය ය.

(3) රූප විපර්යාසය ය. (4) උත්ථානය ය.

35. විශ්මය දනවන ක්‍රියාදාමයක් හරහා දෙවියන් වහන්සේට දේව රාජ්‍ය ක්‍රමක්‍රමයෙන් වර්ධනය කරන බව ප්‍රකාශ කරන උපමාව වන්නේ,

(1) අබ ඇටයේ උපමාවය ය. (2) වපුරන්නාගේ උපමාවය ය.

(3) මුහුන් පිළිබඳ උපමාවය ය. (4) බැටළුවන් පිළිබඳ උපමාවය ය.

36. ''මුළු ඊශ්‍රායෙල් ජනතාව අතරවත් මෙතරම් ශ්‍රද්ධාවක් මා දැක නැත'' නුවෙන් ජේසුස් වහන්සේ ප්‍රකාශ කළේ,

(1) මහලේ රෝගී කාන්තාව පිළිබඳව ය. (2) කපර්ණවුමේ ශතාධිපතියා පිළිබඳව ය.

(3) කුදු ස්ත්‍රිය පිළිබඳව ය. (4) ජාති අන්ධයා පිළිබඳව ය.

37. දෙවියන් වහන්සේගේ රාජ්‍යයේ ආහාර වළඳන තැනැත්තේ භාග්‍යවන්තයෙකි.'' මෙය ප්‍රකාශ කළේ,

(1) ස්නාවක ජොහන්තුමා ය. (2) ජේසුස් වහන්සේ ය.

(3) භෝජන සංග්‍රහයට සහභාගී වූ අයෙක් ය. (4) ජේසුස් වහන්සේගේ ගෝලයෙක් ය.

38. නගුලට අත තබා ආපසු බලන කිසිවෙක් දෙවියන් වහන්සේගේ රාජ්‍යයට සුදුසු නොවේ. ජේසුස් වහන්සේ මෙය ප්‍රකාශ කළේ,

(1) ගෝලයන් දොළොස්දෙනාට ය.

(2) ජේසුස් වහන්සේ අනුගාමී වීමට කැඳවීම ලැබුවෙකුට ය.

(3) නායකත්වය දැරීමට පැමිණි අයකුට ය.

(4) ස්ව කැමැත්තෙන් ජේසුස් වහන්සේ අනුගාමී වුවකුට ය.

39. ''ස්වාමිවරුන් දෙදෙනෙකුට සේවය කිරීමට කිසිවෙකුට නුපුළුවන'' මෙම බයිබල් පාඨයේ ස්වාමිවරුන් දෙදෙනෙක් යනු

(1) දෙවියන් වහන්සේ හා ජේසුස් වහන්සේ ය.

(2) දෙවියන් වහන්සේ හා වස්තුව ය.

(3) නායකයා හා සේවකයා ය.

(4) දෙවියන් වහන්සේ හා අන්‍ය දෙවි දේවතාවන් ය.

40. දේව රාජ්‍යයේ තීරණාත්මක මොහොත වනුයේ,

(1) ජේසුස් වහන්සේගේ නැවත පැමිණීමයි.

(2) ජේසුස් වහන්සේගේ නැවත පැමිණීමේ ආසන්න මොහොතයි.

(3) ජේසුස් වහන්සේගේ විනිශ්චය මොහොතයි.

(4) ජේසුස් වහන්සේගේ විනිශ්චය දවසයි.

සියලුම හිමිකම් ඇවිරිණි
All Rights Reserved

**වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව**

# තෙවන වාර පරීක්ෂණය 2020

**10 ශ්‍රේණිය** **ක්‍රිස්තියානි ධර්මය II** **කාලය පැය 2 යි**

| නම/ විභාග අංකයඃ |
|---|

- පළමු ප්‍රශ්නය ඇතුළුව තවත් ප්‍රශ්න හතරක් සහිතව ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.
- පළමු ප්‍රශ්නයට ලකුණු 20 යි. අනෙක් ප්‍රශ්නවලට ලකුණු 10 බැගින් හිමි වේ.

---

(01) (1) ''එහෙත් මට වඩා ආනුභාව සම්පන්න උතුමෙක් එන්නේ ය. එතුමාගේ පාවහන් පටි මුදන්නටවත් මම නොවටිමි'' යනුවෙන් ප්‍රකාශ කළේ කවරෙක් ද? එසේ ප්‍රකාශ කිරීමට හේතුව කුමක් ද?

(2) ජේසුස් වහන්සේ ශ්‍රාවකයින් සැත්තෑදෙනා පිටත් කිරීමේ දී ඔවුන්ට පැවරූ කාර්යයන් දෙකක් සඳහන් කරන්න.

(3) ව්‍යවස්ථාව මිනිසාගේ යහපතට මිස මිනිසා පීඩාවට පත්කිරීමට යොදා නොගත යුතු බව පෙන්වීමට ජේසුස් වහන්සේ කළ ප්‍රකාශය කුමක් ද?

(4) රාජ තේජසින් ජෙරුසලමට පිවිසී ජේසුස් වහන්සේ දේව මාළිගාවේ සිටි වෙළෙඳුන් පළවා හරිමින් කළ ප්‍රකාශය ලියා දක්වන්න.

(5) ජේසුස් වහන්සේ ඔලීව කන්දේ දී සිදුකළ යාච්ඤාව තුළින් අවධාරණය කරනු ලබන්නේ කුමක්දැයි ලියා දක්වන්න.

(6) රෝම ආණ්ඩුකාරයා ඉදිරියෙහි ජේසුස් වහන්සේට එරෙහිව නැගූ චෝදනා දෙකක් ලියා දක්වන්න.

(7) ඔබ පරීක්ෂාවන්වලට හසුනොවන පිණිස නිරන්තර ............................... හා ................................... ක්‍රියා කළ යුතුය. මෙම වාක්‍යයේ හිස්තැනට සුදුසුම වචන යොදන්න.

(8) ජේසුස් වහන්සේගේ දුක් ප්‍රාප්තියට සම්බන්ධ වූවන් හතරදෙනෙකු නම් කරන්න.

(9) දේව රාජ්‍යයේ ප්‍රතිපත්ති දක්වන උපමා 2 ක් ලියන්න.

(10) ජෙරිකෝවේ අන්ධයා සුවපත් කිරීමේ ප්‍රාතිහාර්යය වැදගත් වූයේ කා හටද, එයින් ජේසුස් වහන්සේ ඉස්මතු කළේ කුමක් ද? (ලකුණු $10 \times 2 = 20$)

02 (1) තම වැරදි පෙන්වාදීම නිසා හෙරෝද් රජතුමා ස්නාවක ජොහාන්තුමාට කුමක් කළේද? (ලකුණු 02)

(2) ස්නාවක ජොහාන්තුමා ජනතාවට අනුශාසනා කළේ කෙබඳු ජීවිතයක් ගත කිරීමට ද? (ලකුණු 03)

(3) වත්මන් සමාජයේ ගුණගරුක පුරවැසියන් ලෙස කිතුණු අප ක්‍රියා කළ යුත්තේ කෙසේදැයි පෙන්වා දෙන්න. (ලකුණු 05)



මෙම ප්‍රශ්න පත්‍ර සියලුම සෞඛ්‍යාරක්ෂිත ක්‍රමවේද අනුගමනය කරමින් සෞඛ්‍ය අමාත්‍යාංශයේ නිර්දේශ අනුව මුද්‍රණය, පැකට් කිරීම හා බෙදාහැරීම සිදුකර ඇත.

(03) (1) රෝම අධිරාජ්‍යයා ජුදෙව්වන්ට හිමිකර දී තිබුනේ කුමක් ද? ජුදෙව් ප්‍රධානීන් ලෙස වැජඹුනේ කවුරුන් ද? (ලකුණු 02)

(2) පරිසිවරු තම ධර්මිෂ්ඨ බව පෙන්වීමට කළ ක්‍රියාවන් තුනක් ලියා දක්වන්න. (ලකුණු 03)

(3) වත්මන් සමාජය තුළ බහු ආගමික පරිසරයක ජීවත්වන කිතුණු අප ක්‍රියා කළ යුතු ආකාර 5 ක් උදාහරණ සහිතව ලියා දක්වන්න. (ලකුණු 05)

(04) (1) ''ඔබ යළිත් හැරුණු පසු ඔබේ සහෝදරයින් ධෛර්යමත් කරන්න.'' මෙය කවුරුන් විසින් කා හට කියන ලද ප්‍රකාශයක් ද පෙන්වා දෙන්න. (ලකුණු 02)

(2) මෙසේ ප්‍රකාශ කිරීමට හේතුව කෙටියෙන් පහදන්න. (ලකුණු 03)

(3) කිතුණු දරුවකු වන ඔබට ''ඔබේ සහෝදරයින් ධෛර්යමත් කරන්න' යනුවෙන් කැඳවීමක් ලැබුණොත් ඔබ ක්‍රියා කරන ආකාරය කරුණු පහකින් පැහැදිලි කරන්න. (ලකුණු 05)

(05) (1) මරන්න ගෙනියන බැටළුවකු මෙන්ද උගේ ලොම් කපන්නා ඉදිරිපිට ....................................... යන ශුද්ධ ලියවිලි පාඨය යොදාගනු ලැබුයේ කවුරුන් විසින් ද? කුමක් පැහැදිලි කිරීම සඳහා ද? (ලකුණු 02)

(2) යෙසායා 61 ට අනුව ජේසුස් වහන්සේ සේවයේ පරමාර්ථවලට අනුව උන්වහන්සේ මාංශගත වූ අරමුණු තුනක් ලියන්න. (ලකුණු 03)

(3) ජේසුස් වහන්සේගේ සේවයේ ආදර්ශය ලබමින් කිතුණු දරුවකු වශයෙන් සමාජයේ ඔබ ක්‍රියා කරන ආකාර පහක් කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 05)

(06) (1) දේව රාජ්‍යයේ නායකත්වය දැරීමට සුදුස්සන් වීම සඳහා ජේසුස් වහන්සේ ඔවුන්ට ලබාදුන් උපදෙස් දෙකක් ලියන්න. (ලකුණු 02)

(2) ජේසුස් වහන්සේ සේවක නායකත්ව ආදර්ශනය කළ අවස්ථා තුනක් කෙටියෙන් ලියා දක්වන්න. (ලකුණු 03)

(3) දේව රාජ්‍යයේ පුරවැසියන් ලෙස නායකත්වයේ වගකීම දැරීමට ඔබ ක්‍රියා කළ යුත්තේ කෙසේදැයි කරුණු පහකින් කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 05)

(07) මාතෘකාවට අදාළව කෙටි සටහන් ලියන්න.

(බයිබලයෙන් උදාහරණ 2 ක් වත් සපයන්න.)

(1) පිදීමේ වැදගත්කම

(2) යාච්ඤාව

(3) අරමාතියේ ජෝසෙප්

(4) මුල් ගෝලයින් කැඳවීම (ලකුණු 2 x 5 = 10)

## පිළිතුරු පත්‍රය - I පත්‍රය

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| 01. ( 2 ) | 02. ( 3 ) | 03. ( 1 ) | 04. ( 4 ) | 05. ( 1 ) | 06. ( 3 ) | 07. ( 4 ) | 08. ( 2 ) | 09. ( 4 ) | 10. ( 3 ) |
| 11. ( 1 ) | 12. ( 2 ) | 13. ( 1 ) | 14. ( 2 ) | 15. ( 4 ) | 16. ( 2 ) | 17. ( 3 ) | 18. ( 4 ) | 19. ( 1 ) | 20. ( 4 ) |
| 21. ( 2 ) | 22. ( 1 ) | 23. ( 3 ) | 24. ( 2 ) | 25. ( 2 ) | 26. ( 4 ) | 27. ( 1 ) | 28. ( 3 ) | 29. ( 3 ) | 30. ( 4 ) |
| 31. ( 2 ) | 32. ( 3 ) | 33. ( 4 ) | 34. ( 3 ) | 35. ( 1 ) | 36. ( 2 ) | 37. ( 3 ) | 38. ( 4 ) | 39. ( 2 ) | 40. ( 1 ) |

(ලකුණු 1 x 40 = 40)

## II පත්‍රය

(01) (1) ස්නාවක ජොහන්තුමා
ජනතාව තුළ ඇති වූ ජුදෙව් බලාපොරොත්තුව වන මෙසියස් වහන්සේ ගැන ප්‍රශ්නයට පිළිතුරු වශයෙනි.

(2) සේවකයන් ඉල්ලා යාච්ඤා කරන්න / රෝගීන් සුව කිරීම / නිවෙස්වලට සාමය පතන්න / දෙවියන් වහන්සේගේ රාජ්‍ය පැමිණ තිබෙන බව දැන්වීම

(3) ''සබත මිනිසා උදෙසා මිස මිනිසා සබද උදෙසා නොවේ යනුවෙනි.''

(4) මාගේ ගෘහය, යාච්ඤාවේ ගෘහයක් වන්නේ ය. එහෙත් ඔබ එය සොරුන්ගේ ගුහාවක් කර තිබේ.

(5) දේව කැමැත්තට කීකරුව දුක් විඳීම හා මරණය කැමැත්තෙන් පිළිගැනීම.

(6)
* ජාතිය කැරලි ගැසීමට පෙළඹවීම.
* අධිරාජ්‍යයාට බදු ගෙවීම තහනම් කිරීම.
* තමා ක්‍රිස්තුස් නම් රජකු බව ප්‍රකාශ කිරීම.

(7) යාච්ඤාවෙන් හා ඇදහිල්ල

(8) සිරේනියේ සීමොන්, ස්ත්‍රීන්. සොරුන්, මුර සෙබලුන්, අරමානියේ ජොසෙප්

(9) නැති වූ බැටළුවා / නැති වූ පුත්‍රයා / නැති වූ කාසිය / මහ මංගල භෝජනය

(10) ගෝලයන්ට / ශ්‍රාවකයන්ගේ අධ්‍යාත්මික අන්ධභාවය (ලකුණු 2 x 10 = 20)

(02) (1) ස්නාවක ජොහාන්තුමා සිරගතකර මරණයට පත් කිරීම (ලකුණු 02)

(2) සහෝදරත්වයෙන් ආත්මාර්තකාමී නොවී තමාට ඇති දේ බෙදා ගනිමින් එකිනෙකා පෝෂණය කිරීම. (ලකුණු 03)

(3) සමාජය තුළ ඕනෑම කාර්යභාරයකදී අවංකව, කාර්යක්ෂමව තරාතිරම් නොබලමින් ලාභ නොතකා සාධාරණව හා යුක්තිගරුකව සේවය කිරීම. (ලකුණු 05)

(03) (1) ආගමික නිදහස, පරිසිවරු - සද්දූසිවරු (ලකුණු 02)

(2) මංසන්ධිවල ප්‍රසිද්ධියේ යාච්ඤා කිරීම / වස්ත්‍රවල ශුද්ධ ලියවිලි පාඨ ලියා තිබීම / දන්දීමේ දි හොරණෑ පිඹීම (ලකුණු 03)

(3) අන් අය සමඟ සුහදව සහෝදරත්වයෙන්, සමගිය ඇතිව සහයෝගයෙන් ක්‍රියා කිරීමට අදාල ලියා ඇති පිළිතුරුවලට ලකුණු දෙන්න. (ලකුණු 05)

(04) (1) ජේසුස් වහන්සේ විසින් පේදුරුට (ලකුණු 02)

(2) ශ්‍රාවකයන්ගේ සිත් සාතන්ගේ පෙළඹීම මත වෙනස් වීමට ලක්විමට ඉඩ ඇති බව දන්නා ජේසුස් වහන්සේ ඔවුන්ගේ ඇදහිල්ල නොබිඳෙන පිණිස යාච්ඤා කළ සේක. ඔවුන් සිතින් වැටුණත් යළිත් ඔබ හැරුණු පසු ඔබේ සහෝදරයින් ධෛර්යමත් කරන්න යනුවෙන් ජේසුස් වහන්සේ පේදුරුට වදාළ සේක. (ලකුණු 03)

(3)
* මාගේ අඩුපාඩු හඳා ගනිමින් ජේසුස් වහන්සේ අනුගාමී වීම.
* වැරදි ක්‍රියාවන් වලට යොමු වූ අය සොයා යමින් ඔවුන්ට ජේසුස් වහන්සේ පිළිබඳ කියාදීම.
* අප සභාවේ තරුණ කණ්ඩායම් එක්රැස් කරමින් බයිබල් අධ්‍යයන වලට යොමු කිරීම.
* අප සභාවේ නැතිවූවන් සොයා යාමට පියතුමාට සහය වීම.
* අධෛර්යමත් වූ කිතුණුවන් උදෙසා යාච්ඤා කිරීම.

(ලියා ඇති පිළිතුරු අනුව ලකුණු දෙන්න.) (ලකුණු 05)

(05) (1) පිලිප් විසින් ජේසුස් වහන්සේගේ සේවකත්වය පැහැදිලි කිරීම සඳහා (ලකුණු 02)

(2) දිළින්දන්ට සුභ අස්න දෙසීම, පීඩිතයින් මුදවාලීම, වහලුන්ට මිදීම ලබාදීම, බිඳුණු සිත් ඇත්තන්ට සුවසෙත දීම (ලකුණු 03)

(3)
* ධර්මය දේශනාකිරීම, පීඩාවට පත්වූ අයට උදව් කිරීම, වැරදි කරන අය ඉන් මුදවා ගැනීමට ක්‍රියා කිරීම
* රෝගී අයට ඉන් මිදීමට උපකාර කරමින් යාච්ඤා කිරීම, දිළිඳු වූ අයට සරණක් වීම )

(මෙසේ ලියා ඇති පිළිතුරු අනුව ලකුණු දෙන්න.) (ලකුණු 05

## පිළිතුරු පත්‍රය - ඉතිරි කොටස

(06) (1) * සාමකාමීව සහයෝගයෙන් කටයුතු කිරීම.
* ප්‍රේමයෙන් කටයුතු කිරීම.
* කැපවීමෙන්, වැයවීමෙන් කටයුතු කිරීම. (ලකුණු 02)

(2) * කුඩා දරුවන් අගය කිරීම.
* සේවය අවශ්‍ය අය තමා වෙතට එනතුරු නොසිට සේවය කිරීම සඳහා ඔවුන්ගේ නිවෙස් වෙත යාම.
* ශ්‍රාවකයන්ගේ පාද සේදීම.
* බොහෝ දෙනෙකුගේ මිදීම පිණිස නිහතමානීව සිය ජීවිතය පිදීම. (ලකුණු 03)

(3) * තම කැඳවීමට නිසිලෙස ප්‍රතිචාර දැක්වීම.
* තමා ලැබූ විවිධ හැකියා අන් අයගේ යහපත උදෙසා යොදාගනිමින් රාජ්‍යයේ අභිවෘධිය වෙනුවෙන් නිරතුරු කැපවිය යුතුය.
* ජේසුස් වහන්සේ ප්‍රසන්න වන අයුරින් මුළු හදවතින් කැපවී සේවය කළ යුතුය.
* තමාට භාරවී ඇති සේවය නිසිලෙස ඉටුකරමින් දෙවියන් වහන්සේගේ වගකීමට බැඳී සිටිය යුතුය.
* උන්වහන්සේගෙන් ලත් දේ තුළින් දෙවිඳුන් මහිමයට පත් කළ යුතුය. (ලකුණු 05)

(07) (1) පිදීමේ වැදගත්කම
* ජුදා සමාජයේ ආගමික නීතිය වූයේ දසයෙන් කොටසක් පිදීම දෙවිඳුන් උදෙසා
* ජේසුස් වහන්සේ පිදීමේ වැදගත්කම පෙන්වීමට යොදාගනු ලැබුයේ දෙව් මැදුරේ පඬුරු පිදූ දුගී කාන්තාවගේ ක්‍රියාකලාපයයි. දුගී කාන්තාව තමා සතු සියල්ල පිදීම.
* කිතුණු ආදර්ශය එනම් ධනය, කාලය, තලෙන්තු යන සියල්ලෙන් පිදීම.
* පරිත්‍යාගශීලීව පුදන දීමනා දෙවියන් වහන්සේ අභිමුවෙහි ප්‍රසන්න බව. (ලකුණු 05)

(2) යාච්ඤාව
* දේව සබඳතා ගොඩනගා ගැනීමට අප සතු ප්‍රබල අවියකි.
* ජේසුස් වහන්සේ සේවය ආරම්භ කිරීමට පෙර දින 40 පාළුකරයේ යාච්ඤා කිරීම.
* ශ්‍රාවකයන් තෝරා ගැනීමට යාච්ඤා කිරීම.
* භාස්කම් කිරීමට පෙර යාච්ඤා කිරීම.
* ගෙත්සමන උයනේදී යාච්ඤා කිරීම.
* පන්දහසකට කෑම දීමට පෙර යාච්ඤා කිරීම. (ලකුණු 05)

(3) අරමාතියේ ජෝසෙප්
* ජුදා මන්ත්‍රණ සභාවේ සාමාජිකයකු වේ.
* ජේසුස් වහන්සේගේ ගෝලයන් පවා එතුමා නොහඳුනන බව ප්‍රකාශ කරද්දී කුරුසිපත් කළ ජේසුස් වහන්සේගේ මෘත දේහය ගෞරවාන්විතව සොහොනේ තැම්පත් කිරීමට ඉල්ලීමෙන් ඔහුගේ එඩිතර බව හා කැපවීම පිළිබිඹු වේ. අරමාතිය නම් ජුදෙව් නගරයක ජීවත් වූ අයෙකි. (ලකුණු 05)

(4) මුල් ගෝලයින් කැඳවීම
* තිබේරියස් විල අසලදී මුල් ගෝලයින් කැඳවීම සිදුවීම.
* ජේසුස් වහන්සේ හා සීමොන් අතර සිදුවූ සංවාදය

''දියඹට ගොස් දැල් හෙලන්න'' යනුවෙන් ජේසුස් වහන්සේ පැවසීම සීමොන් ''ඔබගේ වචන නිසා දැල් හෙළමි'' ප්‍රකාශ කොට කාර්යෙහි නිරත වීම. විශාල මසුන් ප්‍රමාණයක් හසුවීම.

මෙතැන් පටන් මිනිසුන් දිනවා ඇතැයි ''පේදුරුගේ ජීවිතයට අභියෝගයක් දීම. පේදුරු, යාකොබ්, ජොහන් මුල් ගෝලයින් වීම. (ලකුණු 05)

(5)